# ජය සිරිමා බෝ වරුණා



"කෙසේ ද මා එය කරන්නේ? කෙසේ ද මා එය කරන්නේ?"

රැලි නැඟුණ නළලත පිරිමදිමින් හෙතෙම සක්මනේ යෙදෙන්නේ ය. වෙන දා තේජෝබල පරාක්‍රමයෙන් පිරී ගිය ඒ වුවනතෙහි අද ඇත්තේ මහත් සංකාවකි, සන්තාපයෙකි.

"අහෝ...! කෙසේ ද මා එය කරන්නේ?"

වරින් වර නඟන මේ පැණයට පිළිතුරු දෙන්නෙක් එහි නො වී. සොළොස් මහා ජනපදයන් දිනා දඹදිව ඒකඡත්‍ර කොට අබිසෙස් ලද අශෝක නිරිඳුන්ගේ මුවින් නිබඳ පිටවනා පැණයෙකි මේ... රාජරාජ මහාමාත්‍යාදී සියල්ලෝ එහි ම වූ. එහෙත් කිසිවෙක් කිසිවක් නො තෙපළත්. බිතු සිතුවම් රූ වැනි වැ ගොළුවී හිඳිත්. ඒ නිහඬ බව යළි බිඳ දමන්නේ රජුගේ මැ මන්දස්වරය යි. මහාධිරාජයෙකු වුව ද ඔහු ද මුමුණනවා පමණි.

"මා සුමිතුරු දෙවන පියතිස්සයන් හට මාගේ ඇති මිත්‍ර ස්නේහය පමණ කළැ නො හැක්කෙකි. ප්‍රිය ඇමතිවරුනි, ජිනේන්ද්‍ර ශාසනය හෙළදිව්හි පිහිටුවන්නට අමෘතය ගෙන වඩින්න යැයි මා පුත් මහේන්ද්‍රයන් වහන්සේට මා අනුබල දුන්නේ එනිසාවෙන්... මනකල් යැ ඒ හෙළදිව... උන්වහන්සේ එහි සසුන්කෙත පිහිටුවා අවසනයැ අප වෙත හසුන් එව්වේ..."

රජුගේ වතෙහි මොහොතින් ඇකී මැකී ගියේ මඳ සිනාවෙකි.

"හෙළදිව්හි කුලකතුනට ද ඒ අරහත් ධජය සැපතක් මැ යි සිතී අප දියණි සඟමිත් තොමෝ එහි සපැමිණෙන තුරු බලා හිඳින්නේ ලු.."

රජු මේ පවසන්නේ මෙහි රැඳී සිටින රාජකීයයන් නො දන්නා කථාවෙක් නො වේ. අරිට්ඨ ඇමතියන් ප්‍රමුඛ හෙළදිව දූතයන්ගේ ආගමනයට හේතුව ඔවුහු දන්නෝ ම ය.

"ප්‍රිය ඇමතිවරුනි, ශාසන බන්ධු වූ මා හට ඕ තොමෝ එහි යවන්නට පැකිළීමෙක් නො වේ. සංඝමිත්තා තෙරණියෝ ද එහි යෑම රුචි කරන්නී ය. දරුවන්ගෙන් වෙන්වීම සෑම පියෙකුට ම මෙන් ම මට ද දුකක් මැ වුවත් තථාගත සසුනට කළ යුතු මෙහෙවර වෙනුවෙන් ඒ දුක උහුලා සිටින්නට මම වඩාත් කැමැත්තෙමි."

අමාත්‍යවරු සිරසින් නැමී ගෞරව කළහ. ශාසන හිතකාමී ස්වකීය ස්වාමියා ගැන ඔවුන් සිත්හි ඇත්තේ ද අභිමානයෙකි; ගෞරවයෙකි.

මහා බෝධි ශාඛාව රන් කටාහයෙහි පිහිටි දින පටන් දින සතළොසක් ගෙවී ගොසිනි. ඒ බෝධි ශාඛාවෙන් අංකුර ද පැණ නැඟී ඇති බැව් දකින රජ තෙමේ තෙවනුවත් දඹදිව්තලයෙන් පුද දිනි බෝ රජුන්.

"එහෙත්.... තථාගතයන් වහන්සේ වසවත් මරුන් පරදවාලූ මොහොතේ සෙවණ සලසා ලූ ඇසතු බෝධි වෘක්ෂයේ දක්ෂිණ ශාඛාව..... අහෝ....! මා කෙසේ ද එය සිඳින්නේ? මා කෙසේ ද එය කරන්නේ?"

වෙව්ලන සුලු වූ හැඬුම්බර ඒ වදන් අබිමුවැ සියල්ල ම යළිත් ගල් ගැසුණු අයුරෙකි. දෑත් එක්කර වැඳගත් රජු ආයාසයෙන් වදන් ගොනු කර ගනී.

"ඒ සම්බුදු සමිඳුන් සරණ ගිය කල පටන් ආයුධ නො නැඟූ අත් ඇතිවැ හුන්නෙමි මම. දිග්විජය දම්විජය කළෙමි මම. එහෙවි මා.... කෙලෙස ද දිවමන් සම්බුදුරජුන් වන් මහා බෝධීන් වහන්සේට ආයුධ නඟන්නේ? කෙලෙස ද ඒ දක්ෂිණ ශාඛා වහන්සේ සිඳින්නේ? ලෙයින් උපන් දරුවන් හෙළදිවට යවන්නට හැකි වුව ද නො හැක්කේ ම යැ මට මෙය.... හද දැදුරු වන්නාක් වැනි යැ. අහෝ....! කෙසේ ද මා බෝධි ශාඛාව වෙන් කර හෙළදිව කරා යවන්නට සිත් සදා ගන්නේ..? නො හැක්කේ ම යැ. නො හැක්කේ ම යැ..."

කථා කළ යුතු මොහොත මෙය බව මහාදේව අමාත්‍යවරයා හඳුනා ගති. මන්දස්වරයෙන්, එහෙත් පැහැදිලි ව ඇසෙන පරිදි තෙපළේ යැ ඔහු මෙවදන්.

"අවසර මහරජතුමනි, ශාසන බන්ධු වූ ඔබ වහන්සේ සියල් ශාසන කෘත්‍යයන් ඉටු කළේ බුද්ධ පුත්‍රයන් වහන්සේලා විමසා ම යැ. දැනුදු කළ යුත්තේ එය ම යැයි යන්න අපගේ ද අදහස යි. ඔබ වහන්සේ ශෝක නො කරත්වා! අපගේ පරම කල්‍යාණමිත්‍ර වූ මොග්ගලීපුත්ත තිස්ස ආර්යයන් වහන්සේ විචාරා සියල් සැක සංකා දුරු කරගනිත්වා!"



අශෝක අධිරාජයාගේ මාළිගයේ සංඝයා වහන්සේ විෂයෙහි දන් පිරිනමා අවසන් ය. අධිරාජයාණන් මොග්ගලීපුත්ත තිස්සයන් වහන්සේට එකත්පස්වැ හිඳගති.

"ස්වාමීනි, හෙළදිව්හි ගෝතම ශාක්‍ය ශාසනය පිහිටුවිණි. ධර්මයේ හැසිරීම රුචි වූ එදිවෙහි කුලකතුනගේ පැවිද්ද උදෙසා සංඝමිත්තාවන් එහි වැඩම කරවන්න යැයි මට හසුන් එවී යැ. පූර්වයේ තුන්බුදුවරයන් වහන්සේලා සේවනය කළ උතුම් බෝධි වෘක්ෂයන්ගේ දක්ෂිණ ශාඛාවන්ගෙන් හිස් නො වූ එහි මැ අප මහා බෝධියේ දක්ෂිණ ශාඛා වහන්සේ ද රෝපණය කළ යුතු යැයි ඔවුහු කියත්. ස්වාමීනි, බෝධීන් වහන්සේගෙන් වෙන්වීමක් මට කළ නො හැක්කේ යැ. අප කෙරෙහි පරම හිතෛෂී වූ මුඹවහන්සේ මැ කළයුත්ත පෙන්වා දෙන සේක්වා!"

"පින්වත් මහරජ, අප දක්ෂිණ බෝධි ශාඛාව හෙළදිවට යැවියැ යුතු ම ය. ලෝ සුවය සලසා පරිනිර්වාණ මංචකයේ වැදහොත් මොහොතේ අපගේ සර්වඥයන් වහන්සේ අධිෂ්ඨාන පසෙක් කොට වදාළ සේක් මැ යි. හෙළදිව්හි රෝපණය පිණිස බෝධි ශාඛාව ගැනීමට අශෝක අධිරාජයා එළැඹුණු කල්හි බෝධි ශාඛාව තමන් ම සිඳී රන් කටාහයෙහි පිහිටාවා! යන්න පළමු වැන්න යැ. බෝධි ශාඛාව පිහිටන කල්හි එය හිම වලා ගැබක් අතරට වැද සිටීවා! යන්න දෙවැන්න යැ. දින සතෙකින් නැවතැ රන් කටාහයෙහි පිහිටි කෙණෙහි පත්‍රයන්ගෙන්, ඵලයන්ගෙ න් ෂඩ්වර්ණ සම්බුද්ධ රශ්මීන් විහිදේවා! යන්න තෙවැන්න යැ. දෙවන පෑ තිස් රජුන් ලක්දිව් ථූපාරාම සෑය කරවා දකුණු අකු ධාතූන් වහන්සේ පිහිටන කල්හි යමා මහා ප්‍රාතිහාර්ය කෙරේවා! යන්නත්, ලක්දිව ඉදිවන මහා සෑයෙහි ද්‍රෝණයක් වූ සම්බුද්ධ ධාතූන් පිහිටන කල්හි බුද්ධ වේශය ගෙන අහසට පැන නැගී යමා මහා පෙළහර කෙරේවා! යන්න සතර වැන්න සහ පස්වැන්න යැ. ඒ ගැන විමති රහිත වෙත්වා! මහරජ, බෝධි ශාඛාව එහි පිහිටුවිය යුතු බැවි බුද්ධානුශාසනාව යි. අපි එපරිද්දෙන් මැ කළ යුත්තෝ වන්නෙමු.

**දක්ෂිණ බෝධි ශාඛාව පිරිවැරුවන් සහිත වූ නෞකාව මහා සාගරයට වන් කල්හි යොදුනක් තැනෙහි දිය රළ නො නැඟ සංසිඳුණේ වී යැ. හෙල්මැලියෙන්, අරවින්දයෙන් හාත්පස වැසී ගියේ වී යැ. දෙව්යෝ පංචතූර්ය නාද නඟන්නේ, නොයෙක් පූජාවන්ගෙන් බෝධි ශාඛාව පිදූහ.**



නේරංජරා නදී තෙර වෙත පැමිණෙනා මහා ජන ගඟෙකි. දහස් ගණනින් රහතන් වහන්සේලා යැ, දහස් ගණනින් අභිෂේක ලද රජ දරුවන් යැ, අප්‍රමාණ ජන සමූහයක් යැ ඒ. බෝධීන් වහන්සේ තිරයකින් වට කරවාලූ අශෝක නරනිඳුන් ඇඳිලි බැඳගෙන ඒ දෙස බැලී. දක්ෂිණ ශාඛා වහන්සේ සම්බන්ධ වූ සතර රියනක පමණ පෙදෙස හැර අන් ශාඛාවෝ සියල්ල එකෙණෙහි ම නො පෙනී ගියෝ යැ. මේ බැව් දුටු අශෝක නරනිඳුන් මහත් සේ තුටු පහටු වූයේ දඹදිව් තලයෙන් පුදා අභිෂේක කර වී යැ බෝ රජුන්. ඉනික්බිති සුගන්ධ ධූපයෙන් පුද, තුන් වරෙක ම බෝධීන් වහන්සේ ව පැදකුණු කොටැ අට තැනෙක හිඳ ඇඳිලි බැඳ වන්දනා කොටැ නමස්කාර කළේ යැ.

දක්ෂිණ බෝධි ශාඛාව දක්වා උස් වූ ස්වර්ණ ම ය ආසනයෙක ස්වර්ණ ම ය කටාහය තැබ්බවිණැ. මැණික් අසුනෙක නැගී රන් තෙලි කූරක් අතින් ගත් රජ තෙමේ ශාඛායෙහි රේඛාවක් ඇඳියැ. ඉනික්බිති පසෙක හිඳ සත්‍ය ක්‍රියා කළේ යැ.

"සුගත තථාගත අප මහා මුනීන්ද්‍රයාණන් වහන්සේ සම්‍යක් සම්බුද්ධත්වයට පත් වූ පරමෝත්තම මොහොතේ සෙවණ සලසා ලූ මේ උත්තම බෝධීන් වහන්සේගේ දක්ෂිණ බෝධි ශාඛාවෝ හෙළදිවට වැඩම කරවියැ යුත්තේ ම නම්... ඒ සම්බුදු සසුන දීනා ධර්මාශෝක නම් වූ මා සර්වඥ ශාසනයෙහි විමති රහිත වූයේ නම්.... මේ දක්ෂිණ බෝධි ශාඛාවෝ තොමෝ මැ සිඳී රන් කටාහයෙහි පිහිටාවා!"

ඒ බෝධි ශාඛා තොමෝ යා යුතු වී යැ හෙළදිව්... ඒ දම්සෝ නිරිඳු තෙමේ ද විමති රහිත වූයේ යැ සසුනෙහි... තමා මැ සිඳුණු දක්ෂිණ බෝධි ශාඛාවෝ පිහිටියේ යැ රන් කටාහයෙහි...

නේරංජරාව අසබඩ සාදු නාදයෙන්, ප්‍රීති ඝෝෂායෙන් ඇළලී ගියේ යැ. අඟල් තුනෙන් තුනට ලකුණු කළ රේඛායෙන් පැණ නැඟුණු මුල් කටාහයෙහි පිහිටි සැණින් මහීකාන්තාව ද කම්පා විණැ. දෙව්, බඹ, මිනිස් කැල සැදැහැයෙන් නැඟූ සාදු නාදයෙන් සකල දඹදිව මැ පිරී ගත්තේ යැ.

ඒ බෝධි ශාඛාවෙහි කුඩා ශාඛා පහකි, ඵල ද පහකි, කුඩා රිකිලි ද ඇත්තේ යැ. ඒ බෝධි වෘක්ෂයෙහි ඵල පත් ආදියෙන් ඉක්ම ගත් ෂඩ්වර්ණ රශ්මියෙන් සක්වළ එළි විහිද ගියේ යැ. එසේ පෙළහර පෑ ඒ බෝධි ශාඛාව සහිත රන් කටාහය වලාකුළු අතරට පැණ නැගී නො පෙනී ගියේ යැ.

සත් දිනක් ඉක්ම ගියේ යැ. භේරිවාදනයන්, නෙක පූජෝපහාරයන් මධ්‍යයේ අතු, කොළ, ඵල සහිත බෝධීන් වහන්සේ සහිත රන් කටාහය පොළොවට පැමිණියේ යැ. ඒ අසිරියෙන් මහත් සේ පිනා



**ක්ෂණයෙහි මහා බෝධි තොමෝ අහසට පැන නැඟී සවණක් රැස් විහිදුවාලු සේක් මැ යි ... හෙළදිව් එකලූ කළ ඒ ෂඩ්වර්ණ බුද්ධ රශ්මියෝ බඹ ලොවැ දක්වා පැතිර ගිය සේක් මැ යි ... පෙළහර දැක පැහැදුණු සිත් ඇත්තෝ දස දහසෙක් විදසුන් වඩා උතුම් ක්ෂීණාශ්‍රවභාවය සාක්ෂාත් කළ සේක් මැ යි**

ගිය අශෝක නරනිඳුන් මහාබෝධි ශාඛාව දෙවැනි වත් පිදී යැ දඹදිවින්.

මහා බෝධි ශාඛාව රන් කටාහයෙහි පිහිටි දින පටන් දින සතළොසක් ගෙවී ගොසිනි. ඒ බෝධි ශාඛාවෙන් අංකුර ද පැණ නැඟී ඇති බැවී දකින රජ තෙමේ තෙවනුවත් දඹදිව්තලයෙන් පුද දිනි බෝ රජුන්.

ඉනික්බිති වැ බෝධීන් වහන්සේ සංඝමිත්තාවන්ට ද එහි පරිපාලනය විධුරින්ද නා රජුන්ට ද පවරා බෝධියේ හුදුමහත් කටයුතු පිණිස යෙද වූ බෝධාහාර කුල දහඅටක ජනයා පිරිවරා නැව් නංවා සතියකින් බෝධීන් වහන්සේ තාම්‍රලිප්තයට වැඩම කරවන ලද්දේ යැ. එහිමැ ඉදි කළ බෝධි මණ්ඩපයෙකැ සතියක් මුළුල්ලේ වඩා හිඳුවා බොහෝ පුද පූජා පැවැත්වී යැ.

බෝධීන් වහන්සේ හෙළදිව් වැඩම කරවනු පිණිස නැව් නංවනු පිණිසැ හිසින් ගෙනැ ගෙල පමණ දියෙහි බැස පැමිණි රජ තෙමේ දෙවන පියතිස් අමාත්‍ය අරිට්ඨයන් හට මෙසේ කී යැ.

"දරුව, මම මේ උත්තම බෝධීන් වහන්සේ සකල දඹදිව්තලයෙන් තෙවරෙක් ම පුදා, ගෙලක් පමණ දියෙහි හිසෙන් ඔසවා ගෙනවුත් මාගේ සුමිතුරාට එවනු ලැබූයෙමි. හෙතෙමේ ද මේ අයුරට ම බෝධීන් වහන්සේ පුදාවා!"

මෙය මැ ලියා හෙළදිවෙට හසුන් දී තෙමේ ආපසු ගොස් වෙරළට වී බෝධි ශාඛාව නො පෙනී යන තුරු මැ කඳුළු පිරි වුවනතින් යුතු ව මැ බලා හුන්නේ ය.


දක්ෂිණ බෝධි ශාඛාව පිරිවැරූවන් සහිත වූ නෞකාව මහා සාගරයට වන් කල්හි යොදුනක් තැනෙහි දිය රළ නො නැඟ සංසිඳුණේ වී යැ. හෙල්මැලියෙන්, අරවින්දයෙන් හාත්පස වැසී ගියේ වී යැ. දෙවියෝ පංචතූර්ය නාද නඟන්නේ, නොයෙක් පූජාවන්ගෙන් බෝධි ශාඛාව පිදූහ.

සාගර පත්ලවාසී නාගයෝ නොයෙක් උපක්‍රමයෙන් බෝධි ශාඛාව තමන් සන්තක කරගන්නට තැනූහ. මහා බල ඇති සංඝමිත්තා රහත් මෙහෙණි තොමෝ ඍද්ධිමත් වූයේ, ගුරුළු වෙසක් ගෙන ඒ නාගයන් මැඬලූහ. බල සිඳී ගත් නාගයෝ රහත් තෙරණින් වහන්සේට අයැද මහා බෝධිය නාග භවනයට ගෙන ගියෝ යැ. සත්දිනක් මුළුල්ලේ නාග රාජ්‍යයෙන් ද නෙක පූජායෙන් ද පුදනු ලැබූවෝ යළි බෝධි ශාඛාව නෞකාව කරා වැඩම කෙරූවහ.

දඹකොළ පටුනෙහි පටන් අනුරපුර අග නුවර දක්වා මඟ විසිතුරු ව සැරසිලි කෙරවූ දෙවන පියතිස්ස රජ තෙමේ උඳුවප් මසැ පළමු දිනයේ පටන් බෝධි ශාඛාව ද භික්ෂුණී සංඝයා ද හෙළදිව් සැපත් වනතුරු මැ මඟ බලා හුන්නේ යැ. ඒ උත්තම නෞකාවෝ හෙළදිව් වෙරළ සමීපයට පැමිණි කල්හි පෙර දිනෙකැ දමිසෝ නිරිඳු ගෙල තෙක් දියෙහි බැස බෝධි ශාඛාව වැඩම කරවූයේ යම් අයුරකින් ද ඒ අයුරින් මැ ගෙල තෙක් දියෙහි බැසැ මහා බෝධිය සිරසින් ගෙනැ වෙරළට වැඩම කරවූයේ යැ.

එහි මැ මනහර මණ්ඩපයක් තනා බෝධීන් වහන්සේ වඩා හිඳුවා හෙළදිව් රාජ්‍යයෙන් පිදීයැ. තෙමේ මැ එහි දොරටුපාල ලෙස වෙසෙන්නේ තෙදිනක් මුළුල්ලේ මහා බෝධිය රක්ෂා කළේ යැ. නා නා විධ පූජාවන් කෙරෙමින්, සුදු වැලි ද නා නා විධ පුෂ්පයන් ද අතුල, ඔසවන ලද්ද වූ ධජ පතාකාදියෙන් සරසන ලද මඟෙහි දිවා රැය ගමන් කොට උඳුවප් මස තුදුස්වක දිනයේ මහා බෝධි ශාඛාව සහ සපිරිවර උත්තර ද්වාරයෙන් අනුරාධපුර නගරයට එළඹුණහ.

ඉනික්බිති ව රජ තෙමේ දක්ෂිණ ද්වාරයෙන් නික්මුණේ, මේ මහා භද්‍ර කල්පයෙහි දී සතර සම්බුදුරජාණන් වහන්සේලා විසින් සමවත් සුවයෙන් වැඩ හිඳිමින් සේවනය කළා වූ මහමෙව්නාව උයනට ප්‍රවිෂ්ට වූයේ යැ. පූර්වයේ තුන් බුදුවරයන් වහන්සේලා සම්‍යක් සම්බෝධිය





සාක්ෂාත් කළ මොහොතේ සෙවණ සලසා ලූ බෝධි වෘක්ෂයන්ගේ දක්ෂිණ ශාඛාවන් රෝපණය කළ බිම මැ ගොයුම් ගොත් සම්බුදුරජුන් සේවනය කළ බෝධි වෘක්ෂයේ දක්ෂිණ ශාඛා වහන්සේ ව රෝපණය කිරීම පිණිස මනාව සකසා තිබුණේ වී යැ.

ඒ මනෝරම්‍ය වූ භූමි භාගයේ දී 'ඒ භගවත් අරහත් මුනින්ද්‍රයාණන් වහන්සේ විසින් සෙවිනා ලද ඇසතු බෝධියෙ දක්ෂිණ ශාඛා වහන්සේ මෙතැන්හි රෝපණය කරන්නෙ මැ' යි රජ තෙමේ බෝධි ශාඛාව අතින් මුදාහල

සූර්යයා අවරදිගින් බැස යන මොහොතේ මහා බෝධි තොමෝ පෘථිවියෙහි පිහිටියේ යැ. පොළොව සැලී කම්පා විණැ. මහාමේඝය පොළෝ තෙත් කරමින් ඇද හැළුණේ විණැ. ශ්වේතවර්ණ වලාවන් හාත්පසින් එක්ව මහාබෝධිය වසා ගත්තේ වි යැ.

ක්ෂණයෙහි මහා බෝධි තොමෝ අහසට පැන නැඟී සවණක් රැස් විහිදුවාලූ සේක් මැ යි... හෙළදිව් එකලූ කළ ඒ ෂඩ්වර්ණ බුද්ධ රශ්මියෝ බඹ ලොවැ දක්වා පැතිර ගිය සේක් මැ යි... පෙළහර දැක පැහැදුණු සිත් ඇත්තෝ දස දහසෙක් විදසුන් වඩා උතුම් ක්ෂීණාශ්‍රවභාවය සාක්ෂාත් කළ සේක් මැ යි...

සූර්යයා අවරදිගින් බැස යන මොහොතේ මහා බෝධි තොමෝ පෘථිවියෙහි පිහිටියේ යැ. පොළොව සැලී කම්පා විණැ. මහාමේඝය පොළෝ තෙත් කරමින් ඇද හැළුණේ විණැ. ශ්වේතවර්ණ වලාවන් හාත්පසින් එක්ව මහාබෝධිය වසා ගත්තේ වී යැ.

සත්දිනෙක් ගෙවුණු කල්හි හිමවන් වලාවන් ද මහාමේඝයන් ද පහව ගොස් සවණක් රැසින් ලෙලුම් දුන් විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පෙනී ගියේ යැ. දෙව් මිනිසුන් සාදුකාර නගමින් ඇසිපිය නො හෙළා බලාගත්වන ම සිටිය දී මහාබෝධියේ පූර්ව දිග ශාඛාවෙන් ගිලිහීගත් විළිකුන් බෝ ඵලය සුරතින් ගත් මහා මහේන්ද්‍ර ස්ථවිරයන් වහන්සේ එය රෝපණය කරන්න යැයි රජු අතට පත් කළ සේක. රජ තෙමේ සුගන්ධවත් පස් පුරවාලූ රන් කටාහයෙක එය රෝපණය කරන ලද්දේ එකෙණෙහි එයින් අංකුර අටෙක් පැන නැඟිණැ; ඒ බෝධි අංකුරයෝ සතර රියන් වැ නැඟුණෝ විණැ. එබැවි දුටු නරනිඳුන් මහා බෝධිය සේසතින් පිදුයේ සකල හෙළදිවෙන් යළිදු අභිෂේක කළේ යැ.

ඒ අෂ්ටඵලරුහ බෝධීන් වහන්සේලා දඹකොළ පටුනෙහි ද තිවන්ක ග්‍රාමයෙහි, ථූපාරාමයෙහි, ඉසුරුමුනියෙහි, පළමු සෑ මළුවෙහි, සෑගිරි අරමෙහි, කතරගමෙහි හා සඳුන්ගමෙහි රෝපණය කරන ලද්දේ වියැ. අනෙක් බෝධි ශාඛා හතරෙන් පැන නැඟි ඵලයන්ගෙන් ජනිත වූ දෙතිසක් වූ බෝධි අංකුරයෝ හෙළදිව් හාත්පස යොදුනෙන් යොදුන රෝපණය කෙරිණැ.

එකල්හි මැ පිරිවර සහිත වූ අනුලාවෝ සංඝමිත්තා රහත් මෙහෙණි තොමෝ අතින් පැවිද්ද ලබා අරහත් ධජය දැරූවෝ, සකල ක්ලේෂයන් නසා සසර ඕඝයෙන් නිදහස් ව ගියෝ, හෙළදිව්හි කුලකතුනට සිළුමිණක් වැ අරහත්වය සාක්ෂාත් කළෝ යැ. හත්ථාල්හක මෙහෙණි අසපුවේ වැඩ වාසය කරමින් ඒ භික්ෂුණී සංඝයා ද ගොයුම් ගොත් බුදු සසුන හෙළදිව්හි බැබැළ වූ සේක් මැ යි...

මෙවන් උදුවප් පොහෝ දිනෙක මෙහි වැඩම කොට, තපෝ ගුණයෙන් හෙළදිව් මනකල් කළැ ඒ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේට ද හෙළදිව් මිණි කිරුළ වැ මහමෙව්නාවේ උඩමළුවේ වැඩ වෙසෙනා විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද අපගේ ශීර්ෂ නමස්කාරය ම වේවා!

මහ බෝ වරුණ
උදුලා පද්මාවතී
මහා වංශය ඇසුරෙන් ....

**බෝධි වන්දනාව / ස්ථූප වන්දනාව හා ධර්ම දේශනය සෑම ඉරිදාවකම ප.ව. 5.30 ට පැවැත්වේ.**

Mahamevnawa - Buddhist Monastery - Toronto
11175 Kennedy Road, Markham, Ontario L6C 1P2, Canada
905 927 7117  info@mahamevnawa.ca  mahamevnawa.ca